## ජාතික අධ්‍යාපන ආයතනය
### ගුරු අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාව - 2025/2026

## අයදුම්පත් කැඳවීම (සිංහල මාධ්‍යය)

ජාතික අධ්‍යාපන ආයතනය මගින් මෙහෙයවනු ලබන පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාවේ 2025/2026 අධ්‍යයන වර්ෂය සඳහා සිංහල මාධ්‍ය පාඨමාලාලාභීන් බඳවා ගැනීම පිණිස අයදුම්පත් කැඳවනු ලැබේ.

**1.0 පාඨමාලාවේ ස්වභාවය**

මෙම පාඨමාලාව සති අන්ත සහ පාසල් නිවාඩු කාලවල දී පවත්වනු ලබන අර්ධ කාලීන මාස 18ක පාඨමාලාවකි. ජාතික අධ්‍යාපන ආයතනයේ සහ ප්‍රාදේශීය මධ්‍යස්ථානවල දී මාර්ගගත හා සම්මුඛ සැසි මගින් අධ්‍යයන කටයුතු ක්‍රියාත්මක කෙරේ.

**2.0 අවශ්‍ය සුදුසුකම්**

(I) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු වීම

(II) පිළිගත් විශ්වවිද්‍යාලයකින් / උසස් අධ්‍යාපන ආයතනයකින් ලබාගත් ප්‍රථම උපාධියක් (අවම වශයෙන් අවුරුදු තුනක්) සහිත වීම / පිළිගත් ආයතනයක් විසින් පිරිනමන ලද NVQ 7වන මට්ටමේ සහතිකය

**සහ**

(III) රජයේ හෝ අර්ධ රාජ්‍ය පාසලක / පිරිවෙනක / රජය අනුමත වෙනත් ආගමික අධ්‍යාපන ආයතනයක සේවයේ නියුතු විදුහල්පතිවරයකු (ශ්‍රී.ල.වි.සේ) / ගුරුවරයකු (ශ්‍රී.ල.ගු.සේ)
හෝ ගුරු උපදේශකවරයකු / ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ කථිකාචාර්යවරයකු /ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ නියුතු නිලධාරියකු / ජාතික අධ්‍යාපන ආයතනයේ හෝ පිළිගත් විශ්වවිද්‍යාලයක අධ්‍යයන කාර්ය මණ්ඩලයේ සාමාජිකයකු වීම

(IV) ස්ථිර හා අඛණ්ඩ සේවයේ නියුතු වීම

**3.0 පාඨමාලාවට තෝරා ගැනීම**

ලිඛිත පරීක්ෂණයක් පවත්වා ඉන් සුදුසුකම් ලැබූවන් සඳහා සම්මුඛ පරීක්ෂණයක් පැවැත්වීම මගින් හෝ සම්මුඛ පරීක්ෂණයක් මගින් පමණක් සුදුස්සන් තෝරා ගනු ලැබේ.

**4.0 පාඨමාලාව පැවැත්වෙන ප්‍රාදේශීය මධ්‍යස්ථාන**

| අනු අංක | ප්‍රාදේශීය මධ්‍යස්ථානය | අනු අංක | ප්‍රාදේශීය මධ්‍යස්ථානය |
|---|---|---|---|
| 1 | මහරගම | 8 | මොනරාගල |
| 2 | ගම්පහ | 9 | බිබිල |
| 3 | කළුතර | 10 | කැකිරාව |
| 4 | ඇඹිලිපිටිය | 11 | පොළොන්නරුව |
| 5 | රත්නපුරය | 12 | අනුරාධපුරය |
| 6 | කෑගල්ල | 13 | නිකවැරටිය |
| 7 | බලංගොඩ | 14 | හලාවත |
| | | | |

| අනු අංක | ප්‍රාදේශීය මධ්‍යස්ථානය | අනු අංක | ප්‍රාදේශීය මධ්‍යස්ථානය |
|---|---|---|---|
| 15 | මාතලේ | 23 | කුරුණෑගල |
| 16 | මහනුවර | 24 | කුලියාපිටිය |
| 17 | පේරාදෙණිය | 25 | අම්පාර |
| 18 | නුවරඑළිය | 26 | තංගල්ල |
| 19 | බදුල්ල | 27 | මාතර |
| 20 | බණ්ඩාරවෙල | 28 | ගාල්ල |
| 21 | මහියංගනය | 29 | හම්බන්තොට |
| 22 | ත්‍රිකුණාමලය | | |

5.0 අවම වශයෙන් සුදුසුකම් ලැබූ පාඨමාලාලාභීන් පනස්දෙනෙකුවත් නොමැති මධ්‍යස්ථානවල පාඨමාලාව පවත්වනු නො ලැබේ. එවැනි මධ්‍යස්ථානයක් ඉල්ලුම් කළ අයදුම්කරුවන්ට තම මනාපය පරිදි දෙවැනි මධ්‍යස්ථානය තෝරා ගැනීමට අවස්ථාව ලබා දෙනු ඇත. අයදුම්කරු විසින් තෝරා ගන්නා ලද මධ්‍යස්ථාන පසුව වෙනස් කිරීමට අවසර දෙනු නො ලැබේ. (මේ පිළිබඳ අවසාන තීරණය අධ්‍යක්ෂ ජනරාල් සතු ය.)

6.0 තෝරාගන්නා පාඨමාලාලාභීන් ප්‍රායෝගික ගුරු පුහුණුව සඳහා සති 10ක් ඉගැන්වීමේ කාර්යයේ නිරත විය යුතු ය. ගුරු සේවයේ නිරත නොවන අධ්‍යයන කාර්ය මණ්ඩල නිලධාරීන් මේ සඳහා සුදුසු පාසලක් තෝරාගත යුතුයි.

7.0 **පාඨමාලා ගාස්තු**

අයදුම් කිරීමේ ගාස්තුව රුඃ 1500/- කි. ලියාපදිංචි ගාස්තුව රු. 2000/-කි. **පාඨමාලා ගාස්තුව රු. 96,000/-කි.** පාඨමාලා ගාස්තුව වාරික දෙකකින් ගෙවිය හැකි ය. පාඨමාලාවට ලියාපදිංචි වන අවස්ථාවේ ලියාපදිංචි ගාස්තුව හා පළමු වාරිකය ගෙවිය යුතු ය. (ලියාපදිංචි ගාස්තුව රු. 2000/-, පළමු වාරිකය රු. 66,000/-). ඉහත ගාස්තුවලට අමතරව අවසාන විභාග සඳහා නියමිත විභාග ගාස්තු ද ගෙවිය යුතු ය.

8.0 අයදුම් කරන පිළිවෙළ

**8.1** ජාතික අධ්‍යාපන ආයතනයේ, ගුරු අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියෙන් **www.teachereducation.lk** පාඨමාලාවට අයදුම්පත් කැඳවීම සම්බන්ධ තොරතුරු ලබා හැකි ය.

**8.2** ඉහත දැක්වෙන ගුරු අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියේ Google Form Link ඔස්සේ අයදුම් කළ යුතු ය.

**8.3** ඔබ විසින් සම්පූර්ණ කරන ලද අයදුම් පත්‍රයේ පිටපතක් ඔබගේ විද්‍යුත් තැපැලට (Email) යොමු වන අතර, එම අයදුම් පත්‍රයේ මුද්‍රිත පිටපත ඔබගේ පාසලේ විදුහල්පතිගේ සහ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ අනුමැතිය සහිතව රුඃ 1500/-ක අයදුම්පත් ගාස්තුව ගෙවන ලද බැංකු කුවිතාන්සිය සමග සම්මුඛ පරීක්ෂණ පැවැත්වෙන අවස්ථාවේ දී සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට භාර දිය යුතු ය.

**9.0 අයදුම්පත් ගාස්තුව ගෙවන ආකාරය**

ඕනෑම **ලංකා බැංකු ශාඛාවක** තිබෙන ජාතික අධ්‍යාපන ආයතනයේ, මුදල් තැන්පතු පත්‍රිකාවේ ගෙවීම් කේතය (Payment Reference Number) ලෙස **PE25A00000A1** සඳහන් කර රු. 1,500/-ක් ගෙවා කුවිතාන්සිය ලබා ගත යුතු ය. මෙම ගාස්තුව ප්‍රතිපූරණය කරනු නොලැබේ.

**10.0 සම්මුඛ පරීක්ෂණයට කැඳවීම**

සම්මුඛ පරීක්ෂණයට කැඳවීම සඳහා වන ලිපිය ඔබගේ **විද්‍යුත් තැපැලට පමණක්** යොමු කරනු ලැබේ.

**11.0 අයදුම්පත් කැඳවීමේ අවසන් දිනය 31.03.2025**

**විමසුම**

වැඩිදුර විස්තර සඳහා **0117-601775 / 0117-601703 / 011760744** යන දුරකථන අංකවලට සතියේ දිනවල ප.ව. 1.00 සිට ප.ව. 4.00 දක්වා ඇමතීමෙන් ලබා ගත හැකි ය.

**මහාචාර්ය මංජුලා විතානපතිරණ**
**අධ්‍යක්ෂ ජනරාල්**
**ජාතික අධ්‍යාපන ආයතනය**